# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2269/78 - 2022 මාර්තු මස 04 වැනි සිකුරාදා - 2022.03.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, හපුගස්තලාව ජල සම්පාදන ව්‍යාපෘතියේ රුවන්පුර ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස් වල නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

වාසුදේව නානායක්කාර,
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/NW/441.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 460 සී, රුවන්පුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ''ග්‍රීන්වුඩ් වතුයාය'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි අක්කර 01 පර්චස් 80ක් පමණ වන ඉඩම් කොටස් දෙක :

කැබලි අංක : 01

මායිම් :
උතුරට : වතු මාර්ගය ;
නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : කොරවක්ක ඔය ;
බටහිරට : ඇල.

කැබලි අංක : 02

මායිම් :
උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ;
දකුණට : වතු මාර්ගය ;
බටහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස හා ඇල.

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : අධ්‍යක්ෂ,
කහවත්ත වැවිලි සමාගම,
අංක 52,
මාළිගාවත්ත පාර,
කොළඹ 10.

EOG 03-0769

---

**1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 2 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන අමාත්‍ය, වාසුදේව නානායක්කාර වන මම, එකී මණ්ඩලයට, නා උල වහකෝට්ටේ ජල සම්පාදන ව්‍යාපෘතියේ පීඩන සිඳින ටැංකි අංක 02 ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍යව ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත් කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

**වාසුදේව නානායක්කාර,**
ජල සම්පාදන අමාත්‍ය.

යොමු අංකය : DVP/02/01/MT/437.
2022 පෙබරවාරි මස 25 වැනි දින,
ජල සම්පාදන අමාත්‍යාංශය,
"ලක්දිය මැදුර", අංක 35,
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 428 බී, මැදබැද්ද උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මැදබැද්ද ගමේ පිහිටි, ලියාපදිංචි මිනින්දෝරු ලියනගේ සිරිපාල මහතා විසින් මැන සකස් කරන ලද පිඹුරු අංක 3270 දරන පිඹුරේ කැබලි අංක 01න් කොටසක් වශයෙන් දැක්වෙන ''ඉහළ පේරගස් යාය'' නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්චස් 02ක් පමණ වන ඉඩම් කොටස:

මායිම් :

| | | |
|---|---|---|
| උතුරට | : | මානින්ගමුවේ ගෙදර ඉන්ද්‍රලතාගේ ඉඩම සහ මාර්ගය ; |
| නැගෙනහිරට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| දකුණට | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| බටහිරට | : | මැදබැද්ද සිට ගලේවෙල මාතලේ ප්‍රධාන පාර දක්වා දිවෙන මාර්ගය. |

ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය : පී. ජී. අරුණ ශාන්ත මහතා.
අංක 145 E, පේරගස් යාය පාර,
මැදබැද්ද,
වාසල කෝට්ටේ.

EOG 03-0770

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.